# Trial Monitoring report

**About the case:** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම හා සම්බන්ධ නඩුව

**Case no. : HC 107/21** (**TAB**)

**Courts: High court of Puttalam**

**Date of hearing: 2024.07.16**

**Author (s) of report:** මාධව ඊරියගම

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | **1.** විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා<br>**2.** විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා<br>**3.** විනිසුරු නයෝමි වික්‍රමසේකර මිය | |
| **Attorney General's Dept.** | ජ්‍යෙෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක<br>සමඟ රජයේ අධිනීතිඥ ඉසුරි ජයවර්ධන | |
| **Police (CID / TID etc.)** | **CID Colombo / TID** | |
| **Accused / Suspects** | **1.** අබු හනිෆා මොහොමඩ් මුෆිස් හෙවස් අබු දහිදා<br>**2.** අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් අබු සාෆියා<br>**3.** මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ / ගෆූර් මාමා / ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>**4.** මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>**5.** මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>**6.** මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects** | 1,2 චූදිතයින් වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතාගේ උපදෙස් මත නීතිඥ අද්නාත් ෆසාල් මහතා<br>3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා<br>5 වන චූදිත වෙනුවෙන් නීතිඥ අද්නාත් ෆසාල් මහතා<br>4 චූදිතයින් වෙනුවෙන් නීතිඥ අද්නාත් ෆසාල් මහතා<br>6 වන චූදිත වෙනුවෙන් නීතිඥ ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ අද්නාත් ෆසාල් මහතා | |
| **Aggrieved party** | **-** | |
| **Lawyers for aggrieved party** | **-** | |
| **Supporters of accused / suspects** | - | |

| | | |
|---|---|---|
| **Supporters of aggrieved party** | - | |
| **Others** | - | |
| | | |

**2. What happened in court hearing?**

("පැමිණිල්ල" යන්නෙන් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා ද "විත්තිය" යන්නෙන් 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ඒ.එච්.එම් අල්තාෆ් මහතා ද අරුත් ගැන්වෙන බව සළකන්න)

මෙදින පළමුවෙන්ම 3 වන විත්තිකරු වෙනුවෙන් ගොනුකරන ලද සාක්ෂි ලැයිස්තුවේ 14 වන සාක්ෂිකාරිය සාක්ෂියට කැඳවන ලද අතර ඇය කොළඹ ජාතික රෝහලේ සේවය කරනු ලබන විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය දීපානි වේවැල්වල මහත්මියයි. ඇය සූම් (zoom) තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගන්නා ලද අතර දිවුරුම් ලබා දීමෙන් පසු මූලික සාක්ෂි විමසීම සිදුවිය. මෙහිදී ඇය විසින් නිකුත් කරන ලද 3 වි 1 a, 3 වි 5, 3 වි 6, 3 වි 1 අ,ආ,ඇ,ඈ,ඉ යන ලේඛන ඇය සතුව පවතීද යන්න මුලින් විමසා සිටි අතර එහිදි එම ලේඛන වල පිටපත් ඇය සතුව පවතින බව සාක්ෂිකාරිය පවසන ලදී. එහිදී 3 වි 6 ලේඛනය යනු 2020.02.28 වන දින මොහොමඩ් නැමැති අයෙකු වෙත ඇහි බැම්ම යට හෝ හිස් කබලේ අස්ථි භග්න සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට එක්ස් රේ ඡායාරූපයක් ලබා ගැනීම සඳහා සාක්ෂිකාරියගේ නිළ මුද්‍රාව යටතේ නිකුත් කරන ලද ලේඛනයක් බව අනාවරණය වූ අතර 3 වි 1 a ලේඛනය එම්.එස්.ඒ ලෙබ්බේ යන අය නමින් ඇස ආශිත තුවාලයක් පවතින බැවින් CT පරීක්ෂණයක් සිදු කිරීමට සිදු කරන ලද යොමු කිරීමක් බවත් සාක්ෂිකාරිය පිළිගන්නා ලදී. එම පත්‍රිකාවේ ඇයගේ නිළ මුද්‍රාව පැවතියත් මේ මොහොතේ ඇය සතුව පවතින පිටපතේ එය පැහැදිලිව සඳහන් වී නොමැති බව පවසන ලදී. විත්තිය විසින් එසේ CT පරීක්ෂණයකට යොමු කිරීමට හේතුව විමසා සිටි අතර ඊට හේතු වූයේ ඇස ආශිත තුවාලයක් පැවතීම බවත් ඒ අනුව මුහුණ අවට යම් අස්ථි බිඳීමක් සිදුව ඇතිදැයි නිරීක්ෂණය කරනු පිණිස එම ඉල්ලීම විකිරණවේදියා වෙත තමා යොමු කළ බව සඳහන් කරන ලදී. කෙසේ නමුත් එම CT පරීක්ෂණයෙන් මුහුණේ අදාළ කොටස සම්බන්ධයෙන් පැහැදිලිතාවයක් ලබාගත නොහැකි බව ජෙයෂ්ට ලේකකාධිකාරවරයා විසින් දන්වා ඇති බවත් ලේකකාධිකාරවරයා එහි වැඩිදුරටත් අදාළ කොටස පරීක්ෂා කිරීමට නම් රෝගියාට NCCT පරීක්ෂණයක් සිදු කළයුතු බවත් එහි සඳහන් කර ඇති බව සාක්ෂිකාරිය විසින් සාක්ෂි ලබා දෙන ලදී. නමුත් එවැනි පරීක්ෂණයක් මෙම රෝගියා වෙනුවෙන් සිදු කර නොමැති බවද වැඩිදුරටත් ඇය සඳහන් කරන ලදී. එහිදී විත්තිය විසින් 3 වි 4 ලේඛනය පිළිබඳව ප්‍රශ්න විමසූ අතර එම වාර්තාව අනුව ඇසෙහි මාංශපේෂීන් ඉරීමක් සිදුව නොමැති බවත් දෙක දෙක පෙනීමක් නොමැති බවත් සඳහන් කර ඇති බව සාක්ෂිකාරිය පවසන ලදී.

මෙහිදී විත්තිය විසින් මූලික ප්‍රශ්න විමසීමේදී නියමිත ලේඛණ පිළිබඳ නිවැරදිව සඳහන් කරමින් ප්‍රශ්න විමසීම සිදු නොකරන බැවින් අධිකරණය විසින් විත්තියට අවවාද කරන ලදී.

3 වි 6 ලේඛනය පිළිබඳව සාක්ෂිකාරිය විසින් පිළිතුරු ලබා දෙමින් පවසා සිටියේ එම ලේඛනය ඇස අවට එක්ස් කිරණ පිටපතක් ලබා ගැනීමට නිකුත් කරන ලද පත්‍රිකාවක් වන බවත් එහි අනෙක් පිටුවේ විශේෂඥ විකිරණවේදියා වෙත යොමු කළ ඇස අසල අස්ථි බිඳීමක් සිදුව ඇති දැයි වාරතාවක් ඉල්ලීම සඳහන්ව ඇති බවත් එහිම පිටසනක් යොදා අස්ථි සහ මුහුණේ පටක වල ගැටලුවක් නොමැති බව විකිරණවේදියා විසින් ලියා ඇති බවයි.

මෙහිදී පැමිණිල්ල වෙනුවෙන් හරස් ප්‍රශ්න දෙකක් විමසා සිටි අතර 3 වි 2 ලෙස රෝග විනිශ්චය පතක් යොමු කර ඇත්ද යන්න සහ ඇස ලඟ පිහිටි තුවාලය පිළිබඳව රෝගියා විසින් ලබා දුන් කෙටි ඉතිහාසයේ සඳහන්ව පවතී ද යන්න විමසූ අතර ඊට පිළිතුරු ලබා දෙමින් නැත යන්න සාක්ෂිකාරිය විසින් සඳහන් කරන ලදී.

ඒ අනුව 3 වන විත්තිකරුගේ සාක්ෂි ලැයිස්තුවේ 2,6,7,10,14,16 සාක්ෂිකරුවන් මෙහෙයවමින් ද 3 වි 1, 3 වි 19, 3 වි 1 අ සිට ඉ, එක්ස් රේ වාරතා, 3 වි 2, 3 වි 4, 3 වි 5, 3 වි 6, 3 වි 7 ලේඛණ ලකුණු කරමින්ද, පැමිණිල්ලේ අධිචෝදනාවේ සාක්ෂි අංක 61 සාක්ෂිය පිළිගැනීමෙන්ද, මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරිය වෙනුවට භාෂා පරිවරතකගේ සාක්ෂිය මෙහෙයවීමෙන්ද 3 වන විත්තිකරුගේ විමසීම අවසන් කරන ලදී.

ඉන් අනතුරුව අතුරු විමසීමේ බිඳහෙලීමේ සාක්ෂි විමසීම ආරම්භ කළ අතර සාක්ෂි අංක 03 කාන්තා උප පොලිස් පරීක්ෂක රේණුකා සාක්ෂියට කැඳවන ලදී. ඇය වසර 33 කට අධික කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති බවත් අධ්‍යක්ෂක කාර්‍යාලය, පාලන අංශය, වෝහාරික පරිගණක ඒකකයේ සේවය කර ඇති බවත් සාක්ෂි ලබා දෙමින් පවසන ලදී.

මෙහිදී 2019 වසරේ පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ බවට සැකකරන තැනැත්තන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ සිරමැදිරි වල රඳවා තිබූ බවත් තමන් ද ඔවුන් සමඟ කතා බහ කර ඇති බවත් එම කතා බහ ආහාර පාන පිළිබඳව සහ ඔවුන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් සීමා වූ පවත් පැවසූ සාක්ෂිකාරිය 2020.04.20 වන දින තමන් සිරමැදිරි පිහිටි අංශයේ කාර්‍ය භාර නිළධාරී වශයෙන් කටයුතු කළ බව පැවසීය.

එදින මුරපොළ පරීක්ෂා කර සටහන් අත්සන් කිරීම තමාට භාර වී තිබුණු බව පිළිගත් සාක්ෂිකාරිය පොලිස් සැරයන් 34798 සොයිසා නිළධාරියා විසින් තමන්ට පාස්කු ප්‍රහාරය සම්බන්ධ සැකපිට අත් අඩංගුවට ගෙන රඳවා සිටි ගෆූර් යන අය අධ්‍යක්ෂකවරයා වෙත යමක් පැවසීමට ඇති බව දැනුම් දුන් බව පවසන ලදී. එහිදී ඒ පිළිබඳව තමන් විශේෂ ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දිසානායක නිළධාරියාට දැනුම් දුන් බවත් එහිදී ඔහු ඒ බව අධ්‍යක්ෂකවරයා වන SSP තිලකරත්න යන අයට දැනුම් දීමට තමන්ට පැවසූ බවත් අධ්‍යක්ෂකවරයා ඍජුව හමුවීම අපහසු බැවින් ඔහු හමුවීමට කාර්‍යාලයෙන් විමසීමක් සිදු කළ බවත් සාක්ෂිකාරිය පැවසීය.

කාර්‍යාලයෙන් SSP තිලකරත්න යනඅය කාර්‍යබහුල බව පවසා සිටි බැවින් සාක්ෂිකාරිය නැවත එය ප්‍රධාන පොලිස් පරීක්ෂක දිසානායක මහතාට දන්වා ඇති අතර ඔහු පවසා ඇත්තේ රාජ්‍ය නිවේදිත නිළධාරියෙකු හට පවසන ලෙසයි. ඒ අනුව සහකාර පොලිස් අධිකාරී උපුල් සේනාරත්න යන අයට ඒ බව දන්වා ඇති අතර ඔහු පවසා ඇත්තේ විශේෂ විමර්ශන සාකච්ඡාවක් පවතින බැවින් එය අවසන් වූ විට අදාළ සැකකරු හමුවිය හැකි බවයි. ඒ පිළිබඳව සටහනක් යොදා සාක්ෂිකාරිය එදින වැඩ කටයුතු අවසන් කර ඇත.

හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කරමින් තමා තුන්වන සැකකරු වෙනුවෙන් විශේෂ රාජකාරියක් සිදු කරේද යන්න විත්තිය විමසා සිටි අතර එහිදි විශේෂ රාජකාරියක් සිදු නොකල බවත් 2020 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට අවස්ථා දෙකකදී පමනක් මොහු සමඟ කතා බහ කළ බවත් තමා කාර්‍යභාර නිළදාරීවරයා වශයෙන් ඔහු සම්බන්ධයෙන් වෙනම සටහන් යොදා නොමැති බවත් පවසන ලදී. මෙහිදී විත්තිය වෙනුවෙන් සාක්ෂිකාරියගේ සටහන් අසත්‍ය සටහන් බවට යෝජනා කර ඇති අතර එම සටහන් යොදා ඇත්තේ බලහත්කාරයෙන් පාපොච්චාරණය කළ

බව පහසු කිරීමට බව යෝජනා කරන ලදී. එසේම ඇය ප්‍රකාශ කරන ලද කරුණු අසත්‍ය බවටද යෝජනා කර ඇති අතර එම යෝජනා සාක්ෂිකාරිය ප්‍රතික්ෂේප කර ඇත. එසේම නැවත ප්‍රශ්න විමසීමේදී අදාළ 3 වන සැකකරු සම්බන්ධයෙන් තමාට පෞද්ගලික අමනාපයක් පවතින්නේද යන්න විමසූ අතර සාක්ෂිකාරිය පිළිතුරු දුන්නේ එලෙස අමනාපයක් නොමැති බවයි.

ඉන් අනතුරුව නැවත සාක්ෂි අංක 13 නොහොත් පෙර විත්තිය විසින් කැඳවන ලද අධිකරණ වෛද්‍ය නිළධාරී සමින්ද රාජපක්ෂ නැමැති සාක්ෂිකරු නැවත සූම් තාක්ෂණය ඔස්සේ පැමිණිල්ල විසින් කැඳ වූ අතර ඔහුගෙන් විශේෂයෙන්ම 3 වි 7 ලේඛණය නොහොත් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කෙටි ඉතිහාසය රෝගියා විසින් ලබා දුන්නේ කුමන භාෂාවකින්ද යන්න විමසන ලදී. එහිදී පිළිතුරු දෙමින් ඔහු පවසා සිටියේ රෝගියා සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් එම රෝග ඉතිහාසය ලබා දීමට කටයුතු කර ඇති බවත් ඒ පිළිබඳව තමන්ට නිශ්චිත මතකයක් නොමැති බවයි. නමුත් ඔහු දමිල භාෂාවෙන් එම රෝග ඉතිහාසය ප්‍රකාශ කළේ නම් ඒ බව ඔහු වෙනම සටහන් තබන බව පැවසීය. හරස් ප්‍රශ්න වලදී විත්තිය විසින් මුස්ලිම් ජාතිකයන් විසින් රෝග ඉතිහාසය ලබා දීමේදී සාක්ෂිකරු දමිළ භාෂාවෙන් ඔවුන් සමඟ කථා කරන්නේද යන්න විමසා සිටි අතර ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ තමා නොදන්නා භාෂාවකින් රෝගීන් සමඟ සන්නිවේදනය නොකරන බවත් අදාළ රෝගියා දමිළ භාෂාව කථා කරන්නේ නම් ඒ සඳහා භාෂාව දන්නා තැනැත්තෙකුගේ සහය ලබා ගන්නා බවයි.

ඉන් අනතුරුව සාක්ෂි සඳහා පො.සැ 34798 චතුරංග සොයිසා නිළධාරියා කැදවූ අතර එහිදී ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දෛනික දිවා රාත්‍රී ආරක්ෂක සේවයේ නියුතුව සිටි නිළධාරියෙක් බවත් ඔහුගේ රාජකාරිය උදේ 8 සවස 4.30 සහ / හෝ සවස 4.30 සිට උදෑසන 8 දක්වා වන කාලරාමුවක පැවති බවත් සැකකරු ආරක්ෂක රාජකාරි සඳහා තමන්ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක සහ ස්ථානාධිපතිවරයාගේ නියෝග හා උපදෙස් පවතින බවත් ඒ අනුව සාක්ෂිකරු සැකකරුවන්ගේ අසනීප, ආහාර සහ අනෙකුත් ගැටලු සම්බන්ධයෙන් විමසා යම් ගැටලුවක් පවතීනම් ඒ බව කාර්යභාර නිළධාරීවරයාට පවසන බවත් දන්වා සිටින ලදී. 2020.04.10 දින තමන්ට 3 වන චූදිත විසින් ඔහුට අධ්‍යක්ෂකවරයා හමුවීමට අවශ්‍ය බව දන්වා සිටි බවත් ඒ අනුව එම පණිවිඩය එදින කාර්යභාර නිළධාරී වශයෙන් සිටි රේණුකා නිළධාරිනියට දැනුම් දීම පමණක් තමා සිදුකළ බව පවසා සිටි අතර හරස් ප්‍රශ්න වලදී තමා විසින් ඒ පිළිබඳව සටහනක් යොදා නොමැති බවත් අදාල චූදිත එම දැනුම්දීම සිදු කලේ සිංහල භාෂාවෙන් බවත් පවසා සිටින ලදී. එහිදී විත්තිය විසින් 3 වන චූදිත අධ්‍යක්ෂකවරයා හමුවීමට අවශ්‍ය බව පවසන ලද බව පැවසීම සහ රේණුකා නිළධාරිනියගේ සටහන් වල ඒ බව සඳහන්ව තිබෙන බව පවසා සිටීම සම්පූර්ණ අසත්‍යක් ලෙස විත්තිය යෝජනා කල අතර එය සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී. නැවත ප්‍රශ්න වලදී සාක්ෂිකරුට 3 වන චූදිත සම්බන්ධයෙන් පෞද්ගලික අමනාපයක් පවතීද යන්න විමසන ලද අතර සාක්ෂිකරුගේ පිළිතුර වූයේ නැත යන්නයි.

ඉන් අනතුරුව 4362 කාන්තා පොලිස් සැරයන් කුමාරි සාක්ෂියට කැඳවන ලද අතර ඇයද වසර 33 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින බවත් ඇය 2020 අප්‍රේල් මාසය වන විට වාණිජ අපරාධ විමර්ශන අංශයේ සේවය කළ බවත් පැවසූ අතර 2020.04.10 දින තමා උපසේවා රාජකාරී කළ බවත් එදින පැය 1.40 ට පමණ සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනෙවිරත්න විසින් සැකකරු ආදම් ලෙබ්බේ යන අය තමා වෙතට එවන ලෙස දුරකථන පණිවිඩයක් ලබා

දුන් බවත් ඒ අනුව තමා පො.සැ. 8175 පාලිත නිළධාරියා සමඟ අදාළ සැකකරු ඔහු වෙත යොමු කල බවත් පවසා සිටින ලදී.

මීට අමතරව කා.පො.සැ 411 උදයංගනී, කා.උ.පො.ප ශිරෝමි, පො.සැ 35124 ප්‍රනාන්දු යන අයගෙන්ද මෙදින සාක්ෂි විමසා ඇත.

7. **Any significant observations inside court room and outside?**

**4. Next date & time: 2024.09.03**